# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

## තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය දරන තනතුරක් වන අතර ස්ථාන මාරු වීම් රහිත වේ.

### නීති නිලධාරී තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී ප්‍රථම උපාධියක් සහිතව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම.

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස වසර 01 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(ඇ) ඉංග්‍රීසි භාෂාවෙන් මනා ලෙස වැඩ කිරීමේ හැකියාවක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර** : කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි MM 1-1 2016 රු. (53,175-10x1,375-15x1,910-95,575/-) වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු. 53,175/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය** : විවෘත තරග විභාගයක් හා / හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමේ.

**වෙනත් කරුණු :**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් නම් ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022.06.11 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ cv@nmra.gov.lk යන විද්‍යුත් ලිපිනයට ඊ-මේල් කිරීම මඟින් හෝ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ යුතුය. ඊ මේල් මඟින් යොමු කිරීමේදී විෂය ලෙසද, තැපැල් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරෙහි ද අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**